#mediaethicsSL #SinhalaPress #lka #Divaina

නිරූපණ ශිල්පිනියක් සහ රංගන ශිල්පිනියක් ලෙසින් සමාජ මාධ්‍ය තුළ ප්‍රකට පියුමි හංසමාලි සම්බන්ධ වීඩියෝවක් පසුගිය දිනවල සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේම විශාල වශයෙන් සංසරණය විණි. මේ සම්බන්ධයෙන් දිවයින පුවත්පතද ලිපියක් පළ කොට තිබිණි. මෙම ලිපිය සමගින් වීඩියෝවෙන් ලබාගත්, පියුමි හංසමාලිට ශාරීරික පහරදීම් සිදුකරනා ඡායාරූපයන්ද පළවී තිබිණි.

මේ සමගින් අපට ඇසිය හැකි ප්‍රශ්න කිහිපයකි. මේ ආකාරයේ ඡායාරූප පළ කිරීම යෝග්‍ය වන්නේද? එසේම මෙම ඡායාරූපයන්හි මෙන්ම සිරස්තලයේද දක්නට ලැබෙන උද්වේගය දනවන සුළු වාර්තාකරණය උචිත වන්නේද? මෙය පැහැදිලිවම කාන්තාවකට එරෙහිව වන ප්‍රචණ්ඩ ක්‍රියාවක් වන අතර, ඒ සම්බන්ධයෙන් මෙම ලිපිය තුළ ආමන්ත්‍රණය වී නොමැත්තේ මන්ද? මේ සම්බන්ධයෙන් අදාළ වින්දිත පාර්ශවය සම්බන්ධ කරගනිමින් කරුණු විමසීමක් සිදුකරන්නට යෙදුණාද?

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?